කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)- 2019

2025 - ජූලි

**BCOME 4554** - කාර්මික නීතිය

ප්‍රශ්න සංඛ්‍යාව : (හත) 07 කාලය : පැය 03 යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක 01**

අ. ශ්‍රී ලංකාවේ ආයතන වල සිටින විවිධ කාණ්ඩවල සේවකයින් කවුරුන්දැයි නම් කර පැහැදිලි කරන්න.

(ලකුණු 15)

ආ. ස්වාධීන ගිවිසුම්කරු, සේවකයෙකුගෙන් වෙන්කර හඳුනා ගැනීම සඳහා අධිකරණය විසින් සකස් කරන ලද පරීක්ෂණ පහක් නම් කරන්න.

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 02**

සාප්පු සහ කාර්යාල සේවක පනතේ දක්වා ඇති විධිවිධාන වෙත යොමු වෙමින් පහත මාතෘකා පිළිබඳ සටහනක් ලියන්න.

අ. වැඩ කරන වේලාවන්

ආ. ව්‍යවස්ථාපිත නිවාඩු

ඇ. වාර්ෂික නිවාඩු

ඈ. මාතෘ ප්‍රතිලාභ

ඉ. පත්වීම් ලිපිය

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 03**

අ. රාජ්‍ය අංශයේ සේවකයින් විසින් වෘත්තීය සමිති පිහිටුවීම පිළිබඳ 1935 වෘත්තීය සමිති ආඥා පනතේ අඩංගු විධිවිධාන මොනවාද ?

(ලකුණු 10)

ආ. වෘත්තීය සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි වෘත්තීය සමිතියකට ලබා දී ඇති අයිතිවාසිකම් සහ වරප්‍රසාද පහක් නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 04

අ. සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල අතර ඇති සමානකම් සහ අසමානතා මොනවාද ?

(ලකුණු 15)

ආ. අර්ථසාධක අරමුදල් දායක මුදල් ලබා ගැනීමට සුදුසුකම් නොලබන සේවකයින් කාණ්ඩ පහක් නම් කරන්න

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 05

අ. 1971 සේවානියුක්තිකයනන්ගේ සේවය අවසන් කිරීමේ පනතේ සඳහන් සේවකයෙකු සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් දක්වා ඇති ක්‍රියා පටිපාටිය විස්තර කරන්න.

(ලකුණු 10)

ආ. කාර්මික ආරවුල් විසඳීම සඳහා කාර්මික ආරවුල් පනතේ අඩංගු විකල්ප ක්‍රම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 06

අ. පඩිපාලක සභා ආඥාපනතේ පඩි පාලක සභාවක් පිහිටුවීම සම්බන්ධයෙන් දක්වා ඇති ක්‍රියා පටිපාටිය කුමක්ද?

(ලකුණු 10)

ආ. පඩිපාලක සභා ආඥාපනත යටතේ පහත දෑ සම්බන්ධයෙන් ඇති ව්‍යවස්ථාපිත අවශ්‍යතා පැහැදිලි කරන්නත

(i) වැටුප් ගෙවීමේ කාලය

(ii) බලයලත් අඩු කිරීම්

(iii) වාර්තා පවත්වා ගැනීම

(ලකුණු 06)

ඇ. පඩිපාලක සභා පිහිටුවා ඇති කර්මාන්ත හතරක් නම් කරන්න

(ලකුණු 04)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 07

"පාරිතෝෂිතය යනු සේවායෝජකයා විසින් විශ්‍රාම යන අවස්ථාවේදී තම සේවකයාට ලබා දෙන මූල්‍යාමය ප්‍රතිලාභයකි." 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීමේ පනත වෙත අවධානය යොමු කිරීමෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අ. පාරිතෝෂිතය ගෙවීමේදී සේවායෝජකයාගේ වගකීම

ආ. පාරිතෝෂිතය ගෙවිය යුතු අවස්ථා

ඇ. පාරිතෝෂිතය ගණනය කිරීම

ඈ. පාරිතෝෂිතය ගණනය කරනු ලබන වැටුප

**(මුළු ලකුණු 20)**